මේ පිළිබඳ කරුණු සඳහන් ලිපි වැඩිදුර කියවීම සඳහා

“උසස්පෙළ බුද්ධ ධර්මය” මුණුපොතේ පිටුව වෙත පිවිසෙන්න





# උසස් පෙළ බුද්ධ ධර්මය

## 8.0 නිපුණතාව

## 8.2 නිපුණතා මට්ටම

## ශ්‍රද්ධාව
## භක්තිය
## අමූලිකා ශ්‍රද්ධාව
## ආකාරවතී ශ්‍රද්ධාව

කොටදූපේ සුමන හිමි



www.pirivena.lk

# ශ්‍රද්ධාව

බුදු දහමේ ප්‍රඥා ප්‍රතිලාභය සඳහා ශ්‍රද්ධාවේ ඇති උපයෝගීතාව පිළිබඳ විවිධ දේශනාවන් තුලදී පැහැදිලි කොට ඇත. ආර්ය මාර්ගයේ මුල බීජය ලෙස ශ්‍රද්ධාව පෙන්වා දී ඇත්තේ එනිසාය. **(සද්ධා බීජං)** ප්‍රඥා ප්‍රතිලාභයට අනුපූර්ව වශයෙන් වැඩිය යුතු ධර්මතා අතර ශ්‍රද්ධාව මුල් පියවර ලෙස දක්වා ඇත.

01 **සද්ධා**,සීල,සුත,චාග,පඤ්ඤා
02 **සද්ධා**,විරිය,සති,සමාධි,පඤ්ඤා
03 **සද්ධෝ**,අප්පබාධෝ,අසඨෝ,ආරද්ධවිරියෝ,පඤ්ඤා
04 **සද්ධෝ**,ආරද්ධවිරියෝ,උපට්ඨිතසති,සමාහිතෝ, පඤ්ඤවා
05 **සද්ධෝ**,හිරිමා,ඔත්තප්පී,අක්කෝධනෝ,පඤ්ඤවා
06 **සද්ධෝ**,සීලවා,බහුස්සුතෝ,පටිසල්ලීනො, ආරද්ධවිරියෝ
07 **සද්ධා**,සීල,බහුස්සුත,පටිසල්ලීන,ආරද්ධවිරිය,සතිමා
08 **සද්ධා**,හිරි,ඔත්තප්ප,ආරද්ධවිරිය,පඤ්ඤා,කායජීවිතේ අනපෙක්ඛා.

සංසාර සැඩ පහර තරණය කිරීමෙහි ලා කුමක් උපයෝගී වනවාද යන්න බුදුන් වහන්සේගෙන් ඇසූ පැනයට(**කථංසු තරතී ඔඝං**) ලබා දුන් පිළිතුර වූයේ "<u>ශ්‍රද්ධාවෙන් ඔඝය තරණය කළයුතුය</u>" (**සද්ධාය තරතී ඔඝං**) යනුවෙනි. (සු නි කසීභාරද්වාජ සූත්‍රය)

ශ්‍රද්ධාව යනුවෙන් දැක්වෙන්නේ "**අවබෝධයෙන් යුතුව**" ඇතිවන පැහැදීමයි. එනම් තථාගතයන් වහන්සේගේ නව අරහාදී ගුණයන් පිලිබඳව ඇති කරගන්නාවූ පූර්ණ අවබෝධයයි.

( සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං - 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො) (ම නි සේඛ සූත්‍රය)

ඇතාගේ අඩිය දුටු පමණින් මහ ඇතා යයි නිශ්චයට නොපැමිණ ඇතා දකින තුරුම ඉදිරියට යන දක්ෂ නාගවනිකයා(ඇත් ශිල්පයෙහි දක්ෂයා) මෙන් ආර්ය ශ්‍රාවකයාද ප්‍රබුද්ධ මනසකින් යුතුව ත්‍රිවිධ රත්නය කෙරෙහි ඇති කරගන්නා වූ සංවේදීතාවම ශ්‍රද්ධාව ලෙස දක්වා ඇත.





ඒ සඳහා සද්ධර්ම ශ්‍රවණයත් ධර්ම ප්‍රත්‍යවේක්ෂණයත් ධර්මානුධර්ම ප්‍රතිපත්තියත් යෝනිසෝ මනසි කාරයත් අවශ්‍ය වේ.මේ තුලින් ඇතිවන දැක්ම නිෂ්ටාවට ගිය ශ්‍රද්ධාවයි.**අවේච්චප්පසාදය** යනු එයයි. එනම් කරුණු දැන ඇති කරගන්නාවූ පැහැදීමයි.බුද්ධ ධම්ම සංඝ සහ ආර්ය කාන්ත ශීලයෙන් සමන්වාගත වීම යනු සෝතාපත්ති අංගයන්ට පැමිණීමයි.

ඉද ගහපති අරිය සාවකෝ බුද්දෙ අවෙච්චප්පසාදොන සමන්නාගතෝ හොති. ධම්මේ.......... සංඝේ...... අරියකන්තෙහිසිලෙහි සමන්නාගතෝ හොති .....ඉමේහි චතූහි සෝතාපත්ති අංගේහි සමන්නාගතෝ හොති.
(ස නි 2 පංචභයවේර සූ 108)

මේ සෝවාන් අංගයන්ගෙන් සමන්විත තැනැත්තා විශේෂ කෙනෙකි. ඔහු පෘතග්ජන භාවයෙන් මිදුනු **ආර්ය ශ්‍රාවකයෙකි**. සෝවාන් කෙනෙකි.හෙතෙම සංසාර වට්ටයට ආපසු නොවැටේ.දුගති භයින් මිදුනෙකි.නියත වශයෙන්ම සම්බෝධියට නැමුණු කෙනෙකි.

(ඛීණනිරයෝම්හි ඛීණතිරච්ඡානයෝ ඛීණපෙත්තිවිසයෝ ඛීණාපායදුග්ගති විනිපාතෝ සෝතාපන්නෝ හමස්මි අවිනිපාත ධම්මෝ නියතෝ සම්බෝධිපරායණෝ)

මේ අනුව පෙනී යන්නේ බුදු දහම තුල සද්ධා ප්‍රතිලාභය ඇති වන්නේ කුමන පදනමක් මත සිටගෙන ද යන්නයි.සියල්ල පිළිබඳ මනා අවබෝධයක් ඇතිව මිස ඉන් මෙහා ඇතිවන පැහැදීම් ඉතා තාවකාලිකය. මුල්බැසීමක් නැත. නිර්වාණය අපේක්ෂා කරගෙන යමෙක් සද්ධාව ඇති කරගන්නේ නම් එය කිසිදා නොසෙල්වෙන්නකි. **අනේපිඬු සිටුහුගේ** ශ්‍රද්ධාව දෙවියන්ට පවා විනාශ කල නොහැකි වූයේ එහි පදනම ශක්තිමත් වූ නිසාය. ආකාරවතී ශ්‍රද්ධාව කුමන පදනමකින් බුදු දහමේ ඉදිරිපත් වී ඇද්ද යන්න මෙයින් මනාව පැහැදිලි වේ.



www.pirivena.lk

උන්වහන්සේ කෙරෙහි ධර්මය කෙරෙහි සංඝයා කෙරෙහි ප්‍රසාදය ඇති කර ගනී.ශාස්තෘ ප්‍රසාදය යනු එයයි.

(යථා යථා බෝ භික්ඛවේ භික්ඛුනෝ සත්ථා ධම්මං දෙසේති. උත්තරීතරං පණීත පණීතං කණ්හ සුක්ක සප්පටිභාගං තථා තථා සෝ තස්මිං ධම්මේ අභිඤ්ඤාය ඉධෙකච්චං ධම්මං නිට්ඨං ගච්ඡති.සත්ථරි පසීදති. සම්මා සම්බුද්ධෝ භගවා ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සුපටිපන්නෝ සංඝෝ). (ම නි 1 වීමංසක සූ 750)

**එසේ ඇතිවූ පැහැදීම ආකාරාවතී ශ්‍රද්ධාවයි.එය හටගත් මුල් ඇත්තකි.ස්ථිරව පිහිටියේය.දැකීම මුල්කොට ඇත.දැඩිය.ශ්‍රමණයෙකු බ්‍රාහ්මණයකු දෙවියෙකු මාරයෙකු බ්‍රහ්මයෙකු සහ ලෝකයේ කිසිඳු පුද්ගලයෙකු විසින් වෙනස් කළ නොහැකි ශ්‍රද්ධාවකි.**

(යස්ස කස්සචී ඉමේහි ආකාරේහි ඉමේහි පදේහි ඉමේහි බ්‍යඤ්ජනේහි තථාගතේ සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා. අයං වුච්චති භික්ඛවේ ආකාරවතී සද්ධා දස්සන මූලිකා දළ්හා අසංහාරියා.සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලෝකස්මිං) (ම නි 1 වීමංසක සූ 750)

මේ පැහැදීම ඇතිවන්නේ ප්‍රශ්නකොට අවබෝධයෙන් ඇතිවන නිගමනයක ප්‍රතිඵලයක් ලෙසයි. අන්ධානුකරණයෙන් යමක් බලෙන් පැටවීමට බුදුසමය උත්සාහ දරන්නේ නැත. මේ ශ්‍රද්ධාවට පත්වීම යනු **සෝවාන්** භාවයට පත් වීමයි.මෙය දර්ශන ප්‍රතිලාභයෙන් පමණක් ඇතිවන්නකි.දර්ශන ප්‍රතිලාභයෙන් ප්‍රහීණ වන ආශ්‍රව තුනකි. එනම් **සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස** යනුයි.

සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසෝ ඉමේ වුච්චන්ති භික්ඛවේ ආසවා දස්සනා පහාතබ්බා (සබ්බාසව සූ ම නි 24)





( අරියසාවකො නිට්ඨං ගතො හොති - ‘සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝො’ති)(ම නි චූලහත්ථිපදෝපම සූත්‍රය)

බෞද්ධ ශ්‍රද්ධාව ආචාරවිද්‍යාත්මක වූත් මනොවිද්‍යාත්මක වූත් වීමංසාත්මකවූත් පුළුල් දෘෂ්ටියකින් ඉදිරිපත් වී ඇත. එය විශේෂයෙන් ම “**වීමංසනය**” මුල් කොට ක්‍රියාත්මක විය යුතුය. ශාස්තෘන් වහන්සේ පවා විශ්වාස කළ යුතුතේ මනා වීමංසනයකින් අනතුරුවයි.

(වීමංසකෙන, භික්ඛවෙ, භික්ඛුනා පරස්ස චෙතොපරියායං අජානන්තෙන තථාගතෙ සමන්නෙසනා කාතබ්බා ‘සම්මාසම්බුද්ධො වා නො වා’ ඉති විඤ්ඤාණායා)( ම නි වීමංසක සූත්‍රය)

පසේනදි කොසොල් රජතුමා බුදුන් විශයෙහි අනේක ප්‍රකාර ගෞරව දැක්වීම පිළිබඳ බුදුන් විමසා සිටි විට තමන් විසින් ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනගත් කාරණා කිපයක් නිසා බුදුන් දහම් සඟුන් කෙරෙහි ගෞරව දක්වන බව පවසන්නට යෙදුනි. එය විචාර පූර්වකව හේතු යුක්ති ඇතිව ඇතිකරගත්තක් මිස හුදු විශ්වාසය නොවේ.

(අත්ථි බො මෙ, භන්තෙ, භගවති ධම්මන්වයො - ‘හොති සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුප්පටිපන්නො භගවතො සාවකසඞ්ඝො’ති)(ම නි ධම්මචේතිය සූත්‍රය)

ශ්‍රද්ධාව ආර්ය මාර්ගයේ පදනම ලෙස පෙන්වා දුන්නද එය නිශ්ඨාව නොවේ. නමුත් නිශ්ඨාවට නොගොස් තථාගතයන් පිළිබඳ ශ්‍රද්ධා මාත්‍රයක් හෝ ඇති කරගන්නේ නම් හෙතෙම ස්වර්ග සම්පත් ලබයි.

(යෙසං මයි සද්ධාමත්තං පෙම මත්තං සබ්බේ තේ සග්ගපරායනා)



www.pirivena.lk

ශාස්තෘ සාසනය තුල මැනවින් ශ්‍රද්ධාව දියුණු කරන්නේ නම් ඒ ශ්‍රාවකයා මේ ආත්මයේ ම දුක් කෙළවර කරන්නේය. එසේ නොවන්නේ නම් නැවත කාම ලෝකය හා සම්බන්ධ නොවන අනාගාමී තැනැත්තෙක් වී එහි දී දුක් කෙළවර කරයි.

(සද්ධස්ස භික්ඛවේ සත්ථුසාසනේ පරියෝගාය වත්තතෝ ද්වින්නං ඵලං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං. දිට්ඨේව ධම්මේ අඤ්ඤා සතිවා උපාදිසේසේ අනාගාමිතාය.)( ම නි කීටාගිරි සූත්‍රය)

ඒ අනුව බලන කල ශ්‍රද්ධාව ආර්ය මාර්ගයේ ගමන් කිරීමේදී ප්‍රමුඛ කාර්යයක් ඉටු කරයි. බුදු දහම ශ්‍රද්ධාව ධනයක් ලෙස ද(**සද්ධා ධනං**) ඉන්ද්‍රිය ධර්මයක් ලෙසද (**සද්ධින්ද්‍රියං**) බල ධර්මයක් ලෙසද (**සද්ධාබලං**) දියුණු කිරීමට උපදෙස් ලබා දෙයි. ප්‍රඥා ප්‍රතිලාභය පිණිස ශ්‍රද්ධාවේ උපයෝගීතාව පෙන්වා දෙන **කීටාගිරි** සූත්‍රයේ අනුපූර්ව ක්‍රියාවලියේ ආරම්භය ලෙස ශ්‍රද්ධාව දක්වා ඇත.(**සද්ධාජාතෝ උපසංකමති, උපසංකමිත්වා පයිරුපාසති...... පඤ්ඤාය ච නං අතිවිජ්ඣ පස්සති**) ආර්ය මාර්ගයේ ශ්‍රද්ධා ප්‍රතිලාභය පිණිස **“සද්ධානුසාරී හා ධම්මානුසාරී”** වශයෙන් කොටස් දෙක් ඇත. ශ්‍රද්ධාව මැනවින් පිහිටන්නේ **“සද්ධාවිමුත්ත”** තත්වයේ දීය. එවිට ඒ ශ්‍රද්ධාව මැනවින් මුල්හටගත්තකි.

(තථාගතෙ වස්ස සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා)

බුදු දහමේ සෑම කාර්යක්ම උපයෝගී වන්නේ කාර්ය සාධනය සඳහා පමණි. ඉන් පසුව ඒවා කරතබාගෙන යාමක් නැත. ඒ නිසා ප්‍රඥාවෙන් සියල්ල අවබෝධ කරගත් උතුම් රහතන් වහන්සේට නැවත ශ්‍රද්ධාවෙන් ප්‍රයෝජනයක් නොමැති හෙයින් උන්වහන්සේ **“අස්සද්ධ”** යනුවෙන් හඳුන්වා ඇත.

## භක්තිය





එහි දී බුදුන් වහන්සේ කාපටික බමුණාගෙන් විමසා සිටින්නේ **මෙය සත්‍යය සෙස්ස බොරුය වශයෙන් තමන් දක්නා බවත් දන්නා බවත් කිව හැකි එකදු බමුණෙක් ඇද්ද** යන්නයි. නැත යන්න පිළිතුර විය. ඒ නිසා බුදුන් වහන්සේ පෙන්වා දෙන්නේ ඔවුන් කරන්නේ ගයන ලද්ද අනුව ගැයීමත් කියන ලද්ද අනුව කීමත් වාචෝද්ග්‍රහණය කිරීමත් බවයි. ඒ නිසා එය මෙසේ විචාරයට ලක් කරයි.**භාරද්වාජ යම්සේ පරම්පරා වශයෙන් බැඳෙන අන්ධ රැලක් වේ.පළමු වැන්නාද මැද සිටින්නාද අග සිටින්නා ද කිසිවක් නොදකී. බමුණන්ගේ කියමණත් මේ හා සමානය. පූර්ව ඇදුරෝ ද මධ්‍යම හැ පශ්චිම ඇදුරෝ ද කිසිවක් නෙදකී.ඒ නිසා මෙය අමූලිකා ශ්‍රද්ධාව නොවන්නේද** යනුවෙනි.

(සෙයාථාපි භාරද්වාජ අන්ධවේණි පරම්පරාය සන්සත්තා පුරිමෝපි න පස්සති.මජ්ඣිමෝපි න පස්සති. පච්ඡිමෝපි න පස්සති. එවමේව බෝ භාරද්වාජ අන්ධවේණූපමං මඤ්ඤේ බ්‍රාහ්මණානං භාසිතං සම්පජ්ජති. පුරිමොපි න පස්සති. මජ්ඣිමොපි න පස්සති. පච්ඡිමෝපි න පස්සති . තං කිං මඤ්ඤසි භාරද්වාජ නනු ඒවං සන්තේ බ්‍රාහ්මණා අමූලිකා සද්ධා සම්පජ්ජති) (ම නි 2 චංකී සු 656)

ඒ නිසා අමූලිකා ශ්‍රද්ධාව යනු හුදු මාත්‍රයෙන් පමණක් යමක් පිළිගැනීමයි. එය බුදුසමයට අනුගත නොවේ.ම නි සංගාරව සූත්‍ර දේශනාවේ සඳහන් කරුණක් මෙහිදී සිහිපත් කිරීම වටී. එනම් එකල සිටි මහණ බමුණන් පිළිබඳ කරන විචාරයයි. ඇතැම් අය **අනුශ්‍රවය** පමණක් ප්‍රමාණිකත්වයේ සැළකූ අතර ඇතමෙක් **තර්කය** ප්‍රමානිකව ගත්හ.ඇතමෙක් **පෙර නොඇසූ දේ ස්වකීය ඥානයෙන් අවබෝධ කර ගත්තේය.** ඒ අනුව මුලින් කී කාරණා දෙකම නියෝජනය කරන්නේ පෙර කියූ අමූලිකා ශ්‍රද්ධාවමයි. බුදුන් වහන්සේ සමාජයට පෙන්වා දුන්නේ එවැනි අන්ධානුකරණයකට යට නොවී තමාගේ ඥානයෙන් යමක් අවබෝධ කර ගැනීමේ පිළිවෙතයි. **පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි** මේ අනුව ශ්‍රාවකයා ශාස්තෘන් වහන්සේ පිළිබඳව තේරුම් ගන්නේ ධර්ම දේශනාවෙනි. ශාස්තෘන් වහන්සේ ඒ ධර්මය මනා ලෙස පැහැදිලිව ප්‍රණීතව පව් පින් පහදමින් දේශනා කරන කල්හි එය අසා සිටින් ශ්‍රාවකයා



www.pirivena.lk

**භගවා සම්මාසම්බුද්ධෝ**
**ධම්මෝ ස්වාක්ඛාතෝ**
**සංඝෝ සුපටිපන්නෝ**

යනුවෙන් විමසා බලා ඇති කරගන්නා අවෙච්චප්පසාදය ආකාරවතී ශ්‍රද්ධාව බවයි.

(අවෙච්චප්පසදෝති ගුණෝ අවෙච්ච ඡානිත්වා උප්පන්නෝ අචලප්පසාදං)

මනොරථපූරණීයේ එන මේ විස්තරයට අනුව පැහැදිලි වන්නේ බෞද්ධ ශ්‍රද්ධාව කෙලින්ම ඥානය හා බැඳී පවතින බවයි. **ඒ නිසා ආගම සීලය හා සම්බන්ධ වන අතර දර්ශනය සම්බන්ධ වන්නේ ඥානයත් සමගයි.** බුදුන් වහන්සේ බුදු දහමේ ඇති ආකාරවතී ශ්‍රද්ධාව ඇගයීමට ලක්කල අයුරුත් අමූලිකා ශ්‍රද්ධාවේ ඇති හානිය පෙන්වා දුන් අවස්ථා පෙළ සාහිත්‍යයේ අන්තර් ගත වී ඇත.

වරක් **චංකී** නැමැති බමුණා බුදුන් වහන්සේ සමීපයට පැමිණි පසු ඔහුගේ අතවැසි කාපටික නම් ත්‍රිවේද පාරප්ප්‍රාප්ත බමුණු තරුණයා මෙසේ විමසා සිටියේය.**පැරණි බමුණන්ගේ පරම්පරාවෙහි පිටක සම්ප්‍රදායෙහි යම් කරුණක් වේ නම් ඒ සියල්ලම සත්‍ය ලෙසත් සෙසු ඒවා බොරු ලෙසත් බමුණන් ප්‍රකාශ කරයි. මේ කරුණෙහි ලා භාග්‍යවතුන්ගේ අදහස කුමක්ද** යන්නයි.

**යමිදං භො ගොතම බ්‍රාහ්මණානං පෝරාණං මන්තපදං ඉතිහීතිහ පරම්පරාය පිටක සම්පදාය තත්ථ ච බ්‍රාහ්මණා ඒකංසේනං නිට්ඨං ගච්ඡන්ති. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති. ඉධ භවං ගෝතම කිමහාති. (ම නි 2 චංකී සු 654)**





බුදු දහමේ උගන්වා ඇති ශ්‍රද්ධාවට සමාන්තරව යන තවත් වචනයක් ලෙස "**භක්තිය**" පෙන්වා දිය හැක. නමුත් එහි සද්ධාවේ ඇති විශේෂත්වය ගැබ් වී නැත. භක්තිය යන ව්‍යවහාරය ඇත්තේ දේවවාදී ආගම් අතරයි. භක්තියේ ස්වභාවය නම් කියූ දෙය ඒ ආකාරයෙන්ම පිළිගැනීම විනා ඒ පිළිබඳ කිසි විචාර පූර්වක බවක් නැත. භක්තිය තුග ඇත්තේ හුදෙක් භය පදනම් කරගත් විශ්වාසයකි.

බහු වේ සරණං යන්ති පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චෙත්‍යානි මනුස්සා භය තජ්ජිතා ( ධ ප)

එය බුදු දහම "**ලෝලත්වයට**" සමාන කොට ඇත. "මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙම ලොල්වූයේ වේද, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම මඳවූ ශ්‍රද්ධා ඇත්තේ, මඳවූ භක්ති ඇත්තේ, මඳවූ ප්‍රේම ඇත්තේ, මඳවූ ප්‍රසාද ඇත්තේ වේද, මහණෙනි, මෙසේ වනාහි පුදගල තෙම ලොල්වූයේ වෙයි"

(කථඤ්ච, භික්ඛවෙ, පුග්ගලො ලොලො හොති? ඉධ, භික්ඛවෙ, එකච්චො පුග්ගලො ඉත්තරසද්ධො හොති ඉත්තරභත්ති ඉත්තරපෙමො ඉත්තරප්පසාදො. එවං ඛො, භික්ඛවෙ, පුග්ගලො ලොලො හොති)(අ නි අවජානාති සූත්‍රය)

**වක්ඛලී** හිමියන්ගේ තිබුණේ ද බුදුන් වහන්සේ පිළිබඳව අසීමිත භක්තියකි. ඒ නිසා බුදුන් වහන්සේගේ ධර්මය අවබෝධ නොකර බුදුන් වහන්සේගේ සිරුර දෙස බලා ඉන්නට විය. ඒ නිසා බුදුන් වහන්සේ වක්ඛලී හිමියන්ට පැවසුවේ "**වක්කලිය, කම්නැත, මේ කුණුකය දකිනු ලැබීමෙන් කිනම් ප්‍රයෝජනයක්ද? වක්කලිය, යමෙක් වනාහි ධර්මය දකීද, හෙතෙම මා දක්නේය, යමෙක් මා දකීද, හෙතෙම ධර්මය දක්නේය**" යනුවෙනි.

( අලං , වක්කලි, කිං තෙ ඉමිනා පූතිකායෙන දිට්ඨෙන? යොඛො, වක්කලි, ධම්මං පස්සති සො මං පස්සති; යො මං පස්සති සො ධම්මං පස්සති)( ස නි වක්කලී සූත්‍රය)



www.pirivena.lk

කරුනු කාරණා පිළිබඳ නිවැරදි වැටහීමක් නැතුව යම් පිළිගැනීමක් වේ නම් එය ඉතා ඉක්මනින් වෙනස් වේ. ඒ පිලිබඳ වටිනා අදහසක් "ම නි අග්ගි වච්ඡගොත්ත සූත්‍රය" තුල සඳහන් වේ. බුදුන් සමග දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව හෙතෙම විමසා සිටින්නේ "විමුත්ත පුද්ගලයා" මරණින් පසු උපදීද යන්නයි. එහිදී බුදුන් වහන්සේ පැවසුවේ. "**උපදී , නූපදී,උපදී නූපදී,නො උපදී නොම නූපදී**" යන ව්‍යවහාර නොයෙදෙන බව ප්‍රකාශ කල විට වච්ඡගොත්ත ප්‍රකාශ කළේ "**ගෞතමයන් වහන්සේගේ මුල් කතා සල්ලාපයෙන් යම් ප්‍රසාද මාත්‍රයක් ඇති වූවා නම් දැන් එය අතුරුදහන් වූ බවයි**"

(යා මේ ඒසා හෝතෝ ගෝතමස්ස පුරිමේන කථා සල්ලාපෙන අහු පසාදමත්තං සාපි මේ ඒතරහි අන්තරහිතා)

ඒ අනුව ප්‍රසාද භක්ති සය සංකල්පයන්හි ඇති තාවකාලික බව මෙයින් පැහැදිලි වේ. භක්තිය බුදු දහම තුල දක්වා ඇත්තේ සත්පුරුෂ අසත්පුරුෂ විශ්වාසය යන අර්ථයෙනි. "අසත්පුරුෂයා අසත්පුරුෂ ධර්මයන්ගෙන් සමන්විත වූයේ අස්පුරුෂයා කෙරෙහි භක්තියට යයි. සත්පුරුෂයා සත්පුරුෂ ධර්මයන්ගෙන් යුක්ත වූයේ සත්පුරුෂයා හා භක්තියට පැමිණේ."

(අසප්පුරිසෝ භික්ඛවේ අසද්ධම්ම සමන්නාගතෝ හෝති අසප්පුරිස භත්ති හෝති.සප්පුරිසෝ.....)( ම නි චූල පුණ්ණම සූත්‍රය)

මේ කරුණු අනුව භක්තියෙහි යම් උයෝගීතාවක් තිබෙන්නට හෝ නොතිබෙන්ට පුළුවනි. විශේෂයෙන් එහි ඇත්තේ බිය හැර වෙන දෙයක් නොවේ. නමුත් ශ්‍රද්ධාවේ ඇත්තේ බියක් නොව අවබෝධයෙන් යුතුව ඇතිවන පිළිගැනීමකි. ඒ නිසා ධර්මාවබෝධයෙහි ලා භක්තිය යන ව්‍යවහාරයේ කිසි උපයෝගිතාවක් නැති බව කිව යුතුය.





## අමූලිකා හා ආකාරවතී ශ්‍රද්ධාව

නිර්වාණාවබෝධය පිණිස ශ්‍රද්ධාවේ උපයෝගීතාව කෙබඳුද යන්න ඉහත කාරණා වලින් පැහැදිලි වේ. එසේම බුදු දහම ශ්‍රද්ධාවේ ස්වභාවය අනුව එය වර්ග කොට ඇත. ඇතැම් තැනක "චල ශ්‍රද්ධාව අචල ශ්‍රද්ධාව" යනුවෙනුත් ඇතැම් තැනක "අමූලාකා හා ආකාරවතී ශ්‍රද්ධාව" යනුවෙනුත් දක්වා ඇත. මෙතැන් සිට අමූලිකා හා ආකාරවතී යන්නෙහි ඇති වෙනස පෙළ දහමට අනුව විමසා බලමු.

මෙයින් අමූලිකා ශ්‍රද්ධාව බුදු දහම අගයන්නේ නැත.වේද වේදාන්ත දර්ශන වලින් පැමිණියේ මේ ශ්‍රද්ධාවයි. එහි දැනීම සහ දැකීම යන කරුනු දෙකම නැත.ඇත්තේ හුදු පිළිගැනීම් මාත්‍රයක් පමණි.එය අවිචාරශීලීය.තර්කානුකූල නැත.විමසීමක් නැත.අන්ද විශ්වාසයකි.ඒ නිසා එහි ඇත්තේ භක්තිය පමණි. නමුත් බුදු දහමේ ඇත්තේ එවැනි පැහැදීමක් නොවේ.සොයා බලා සිතා මතා අර්ථ පරීක්ෂාවෙන් යුක්තව විචාරශීලීව බුද්ධිමත්ව ඇති කරගන්නා පැහැදීමකි.

(ආකාරවතීති කාරණං කාරණී පරියෙසිත්වවා ගහිතත්තා සකාරණා) (පපඤ්ච සූදනි)

බුදු දහම තුල අන්ධව යමක් පිළිගැනීම අගයන්නේ නැත.තථාගතයන් පිළිබඳව වුවත් විමසීමෙන් තොරව පිළිගැනීම දැනීමට බාධාවක් ලෙසයි බුදු සමයේ විශ්වාසය. වීමංසක සූත්‍රයේදි එය මැනවින් පැහැදිලි කරන්නේ බුදුන් වහන්සේ සම්බුද්ධ ද නැද්ද යන කාරණාව විමසීම් බුද්ධියෙන් තේරුම් ගතයුතු බවයි.

(වීමංසකේ භික්ඛවේ භික්ඛුණා පරස්ස චේතෝ පරියායං අජානන්තේන තථාගතේ සමන්නේසනා කාතබ්බා සම්මාසම්බුද්ධෝ වා නොවා ඉති. විඤ්ඤාණාය)

ඒ අනුව විමර්ශනශීලීත්වයෙන් පිළිගැනීම අගය කොට ඇත. එසේම ශ්‍රද්ධාව පිළිබඳ සඳහන් කරුණක් වන්නේ



www.pirivena.lk